පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: **492**

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொகுப்பு இலக்கம் : 492

**நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம், அநுராதபுரம்**

**பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டலள இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்**

**Parliament Publication Collection No: 492**

**Name of the institution : District Secretariat, Anuradhapura**

**Submission of observation of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග

**<u>119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම</u>**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය |
|---|---|
| අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | පිළිගනිමි.<br><br>2024 වර්ෂයේ සිට මේ දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ සියළුම ප්‍රාදේශීය කාර්යාලවල මෙම ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබූ නමුත් නියමිත දිනට විගනණයට ඉදිරිපත් කර නොතිබුණි.<br>මේ වන විට 2025 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර, 2026 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමත කර ඇත. |
| වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිළිතුරු ලබා ගැනීමේදී ප්‍රමාද වී පිළිතුරු ලැබීම හා ලැබී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීම මත නැවත පිළිතුරු කැඳවා අවසන් පිළිතුරු සකස් කිරීම මසක් ඇතුළත සිදු කිරීමට නොහැකි අවස්ථා පැවතුණි.<br><br>මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නියමිත කාල සීමාව තුළ පිළිතුරු ලබාගෙන මසක් ඇතුළත අවසන් පිළිතුර යොමු කිරීමට කටයුතු යොදා ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | විගණන විමසුම් 17 න් 11 ක් සඳහා නියමිත කාල සීමාව තුළ පිළිතුරු යොමු කර තිබූ අතර 06 ක් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු ලබා දී නොතිබුණි.<br><br>මේ වන විට එම විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කර ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 6 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | අපහරණය කිරීමට අදාල වාහන 13ක් අතරින් වාහන 06 ක අපහරණ කටයුතු අවසන් කර ඇත. ඉතිරි වාහන 07 අපහරණය කළ යුතුව පැවතුණි. එම වාහන 07 අපහරණය සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලද පසු පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර කඩිනමින් අපහරණය සඳහා පියවර ගෙන ඇත.<br><br>එම වාහන 13 න් 12ක් මේ වන විට අපහරණ කටයුතු සිදු කර අවසන් කර ඇති අතර, 50-0305 - ඩබල් කැබ්<br>රථයේ අයිතිය කාන්තා කාර්යංශය සතු වන බැවින් අපහරණ කටයුතු එම ආයතනය මඟින් සිදු කරනු ලැබන බවට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MWCA/02/05/06/50-0305 හා 2025.03.25 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. |

| | |
|---|---|
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | වර්ෂයකට වඩා වැඩි ණය ශේෂ ගණයට වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ, සේවය හැර ගිය නිලධාරීන්ගේ මෙන්ම විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගේ ද ණය ශේෂ ඇතුළත් වන අතර වෙන වෙනම ඒ ඒ ණය ශේෂ පවතින නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.<br><br><u>වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ</u><br><br>ආර්.බී.පී.කේ.රත්නවීර මයා<br>ග්‍රාම නිලධාරී<br>තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>වැඩ තහනමකට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවා ගැනීම සඳහා නිලධාරියාට එරෙහිව අංක 00495/M/21 යටතේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිසා අධිකරණයේ පවරන ලද නඩුව 2025.09.09 දින කැඳවන ලද අතර නැවත 2026.06.02 දිනට නඩුව විභාගයට දින නියම කර ඇත.<br><br>ආර්.එච්.කේ.වන්නිනායක මයා<br>ග්‍රාම නිලධාරී<br>ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවා ගැනීම සඳහා නිලධාරියාට එරෙහිව අංක 30483/M යටතේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිසා අධිකරණයේ නඩු කටයුත්තක් සිදු කර ගෙන යන අතරතුර 2022.11.19 දින මෙම නිලධාරියා මිය ගොස් ඇත. නිලධාරියා මිය ගොස් ඇති බැවින් ඉදිරියේදී ඔහුට අදාළ ණය ශේෂය හා හිඟ පොළිය වැන්දඹු අනත්දරු අරමුදල් දීමනාවෙන් පියවා ගැනීමට නියමිතය.<br><br>එච්.ඩබ්.ඩී.ජයසිංහ මයා<br>කාර්මික නිලධාරී<br>පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය 2023.11.30 දිනට පෙර පියවන ලෙස දන්වා මාගේ අංක ANU/DIST/2/7/2/B/37 හා 2023.11.23 දිනැතිව ලිපියක් යොමු කොට ඇති අතර මාගේ සමාංක හා 2024.01.03 දිනැතිව ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවන ලෙස අදාළ නිලධාරියා දැනුවත් කරන ලෙස දන්වමින් නිලධාරියාගේ කලත්‍රයා වන දුම්රිය ලිපිකරු එම්.පී.එස්.ලසන්ති තිලකරත්න මිය වෙත ලිපියක් යොමු කොට ඇත.එහෙත් නිලධාරියා විසින් ණය ශේෂය පියවීම පැහැර හරින බැවින් නීතිපති උපදෙස් විමසා ඇත. |

| | |
|---|---|
| | ඩී.පී.අනුර මයා<br>ග්‍රාම නිලධාරි<br>නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවන ලෙස දන්වමින් නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථා කිහිපයකදී නිලධාරියා දැනුවත් කොට ඇති අතර මාගේ අංක ANU/DIST/2/7/2/B/38 හා 2024.04.15 දිනැති ලිපිය මඟින් දින 14 ක් තුළ ණය ශේෂය පියවන ලෙස දැන්වූවද  තවදුරටත් ගෙවීම පැහැරහරින බැවින් නීතිපති උපදෙස් විමසා ඇත.<br><br><u>සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂය</u><br><br>කේ.එම්.කේ.කාංගර මැණිකේ මිය<br>පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>සේවය හැර ගිය කළමනාකරණ සේවා නිලධාරී කේ.එම්.කේ.කාංගර මැණිකේ මියගෙන් අය විය යුතු ණය ශේෂය හා හිඟ පොළිය අදාළ නිලධාරිණිය විසින් 2023.03.23 දිනැති 595396 අංක දරණ හා 2023.04.20 දිනැති 595467 අංක දරණ රිසිට්පත් මඟින් පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් වෙත සම්පූර්ණයෙන්ම පියවා අවසන් කර ඇත.<br><br><u>විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීගේ ණය ශේෂ</u><br><br>එච්.එම්.එම්.ආර්.කේ.හේරත් මිය ප්‍රාදේශීය ලේකම්<br>ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටියදී විශ්‍රාම ගොස් ඇති මෙම නිලධාරිණියගේ ණය ශේෂය 2024 අප්‍රේල් මාසය තුළ නිලධාරිණියගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් පියවා ගන්නා ලදී. |
| මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ඇස්තමේන්තු අනුමත වීමෙන් පසු අත්තිකාරම් මුදල් ලබා ගැනීමෙන් අදාල පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන අතර ඊට අදාල බිල්පත් එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර අදාල මුදල් ලබාගැනීමෙන් පසු එම අත්තිකාරම පියවනු ලබයි. මෙහිදි බිල්පත් ඉදිරිපත් කර ඊට අදාල ප්‍රතිපාදන ලබා ගැනීම හා බිල්පත් පියවීම සඳහා මෙම කාලය ගත වී ඇත. නමුත් මුදලින් පියවීම් නියමිත පරිදි සිදු කර ඇත.<br>මේ වන විට නියමිත ආකාරයට පියවීම් කටයුතු සිදු කරනු ලබයි. |
| අනුයුක්ත කළ සංවර්ධන නිලධාරින් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/GT/2020(III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය මඟින්, අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බැවින් කාර්ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී ගැටලුවක් පැන නොනඟිනු ඇති බවත් අනුයුක්ත කර ඇති සියලු නිලධරයන්ට රාජකාරි භාර ගැනීමට අවස්ථාව සලසා දීම ද, කිසිදු නිලධාරියෙකු අතිරික්ත නිලධාරීන් ලෙස සලකා කටයුතු නොකරන ලෙසද උපදෙස් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කර ඇත.<br><br>එමෙන්ම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/05-2022 |

| | |
|---|---|
| | හා 2022.09.02 දිනැති ලිපිය මඟින්ද උපාධිධාරි අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන දැනට සේවයේ ස්ථිර කර ඇති නිලධාරීන් සඳහා අදාළ පුද්ගල පඩිනඩි හා අනෙකුත් වියදම් එම නිලධාරීන් ස්ථිර පදනමින් අයත් වන ආයතනවල ඇස්තමේන්තු තුළ අන්තර්ගත කළ යුතු බවට දන්වා ඇත.<br><br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/5/13/4/6 හා 2025.04.07 දිනැති ලිපිය මඟින් දන්වා තිබූ පරිදි, රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන -2020 යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් සඳහා තනතුරු අනුමත කිරීමට අදාළව තත්‍ය කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම සඳහා වූ රැස්වීමක් මාර්ගගත ක්‍රමය ඔස්සේ 2025.04.28 දිනැතිව පැවැත්වූ අතර එම අතිරික්ත නිලධාරීන් දැනට සේවයේ නියුතු කාර්යාලවලට අනුමත කිරීම සම්බන්ධව එහිදී සාකච්ඡා කරන ලදී.<br><br>තවද අතිරික්ත සංවර්ධන නිලධාරීන් සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තළමණාකරන සේවා නිලධාරී පුරප්පාඩු පවතින බැවින්, එම අතිරික්ත නිලධාරීන් මඟින් අදාළ කාර්යයන් සිදුකර ගනී. |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 03ක් හා 2024 වර්ෂයේ කමිටු රැස්වීම් 03ක් ද පවත්වා ඇත.<br><br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 2/2021 හා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත එවා ඇති අංක HA/DEVP/14/DCC Voll -Vii දරණ 2026.11.29 දිනැති ලිපියෙන් ලබාදී ඇති උපදෙස් අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම කමිටු ගරු සභාපතිතුමා/සමසභාපතිතුමන්ලා සමග සාකච්ඡා කර එකඟතාවය හෝ උපදෙස් මත ලබාදෙනු ලබන දිනයන්වලදී රැස්වීම් පැවැත්වීමට දිස්ත්‍රික් ලේකම් සම්බන්ධීකරණ කමිටු ලේකම් වශයෙන් කටයුතු කරනු ලැබේ. |
| දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ 25/2019 අනුව ප්‍රාදේශීය ලේකම් සමුළුව තෝරාගත් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක දී දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත.<br><br>කෙසේ වුවද, 2023 වර්ෂයේ රට තුළ පැවති ඉන්ධන අර්බුදය හා අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීමට සිදු වූ බැවින් ප්‍රාදේශීය ලේකම් සමුළු පැවැත්වීම සීමා කිරීමට සිදු විය.ඒ අනුව 2023 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් සමුළු 05 ක් පමණක් පවත්වා ඇත.<br><br>2026 වර්ෂයේදීද රට තුළ ඉන්ධන අර්බුදයක් පවතින බැවින් ප්‍රාදේශීය සමුළු පැවැත්වීම සීමා කර ඇත. |

| | |
|---|---|
| 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපණත අනුව දිස්ත්‍රික් කෘෂිකාර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ රට තුළ පැවති ඉන්ධන අර්බුදය හා අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීමට සිදු වූ බැවින් දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටු රැස්වීම් වාර 08ක් පමණක් පවත්වා ඇත.<br><br>2026 වර්ෂයේ මාසිකව දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටු පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | 2023 වර්ෂයේ නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් නිවාස කමිටුව මාසිකව පැවැත්වීම අවශ්‍ය නොවන බව නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් දන්වා ඇති බැවින් අවශ්‍යතාවය පරිදි කමිටු වාර 02 ක් පවත්වා ඇත.<br><br>2025 වසරේ නිවාස කමිටු 04 ක් පවත්වා ඇති අතර, 2026 වර්ෂය සඳහා නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරුගේ ඉල්ලීම මත පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ප්‍රගතිය සහ ගැටලු අඛණ්ඩව සමාලෝචනය කිරීම සඳහා මාසිකව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව රැස්වේ. පොහොර කමිටුව නියෝජනය කරනු ලබන සියලුම නිලධාරීන් සහ පාර්ශවකරුවන් මෙම මාසික දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම සඳහාද සෘජුවම සහභාගී වේ. එබැවින්, මාසිකව පොහොර කමිටුව රැස්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් සම්පත් හා කාලය කළමනාකරණය කිරීම සඳහා සහ නිලධාරීන්ගේ කාලය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කළමනාකරණය කරනු වස්, පොහොර සම්බන්ධ සියලුම තීරණ මෙම මාසික කෘෂිකර්ම කමිටුවේදී සාකච්ඡාවට භාජනය කර තීරණ ලබාගෙන ඇත.<br><br>දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු ක්‍රමවත්ව සංවිධානය කිරීම උදෙසා ප්‍රධාන වගා කන්න දෙක (මහ කන්නය සහ යල කන්නය) ඉලක්ක කර ගනිමින් පොහොර කමිටු රැස්වීම් 02 ක් නිල වශයෙන් පවත්වා ඇත. මෙම රැස්වීම්වලදී කන්නයට අදාළ සමස්ත පොහොර අවශ්‍යතාවය, පවතින තොග සහ බෙදාහැරීමේ ජාලයන් පිළිබඳ මූලික සැලසුම් සම්පාදනය කිරීම ක්‍රියාත්මක කිරීම කර ඇත. |
| දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි. | 2023 වර්ෂය සඳහා මාස 3 කට වරක් මිල නියම කිරීමේ කමිටුව රැස්වන ලද අතර ඒ අනුව අදාල වාර්තා නිකුත් කරන ලදි. 2023 වර්ෂයේ දෙවන භාගයේ සිට ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ගණන් යම් ස්ථාවර මට්ටමකට පත් වූ බැවින් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස්වීමේ අවශ්‍යතාවයක් නොවිය.<br>2024,2025,2026 වර්ෂයන් සඳහා අඛණ්ඩව වර්ෂයකට දෙවතාවක් බැගින් මාස 6 කට වරක් දිස්ත්‍රික් මිල කමිටුව රැස්වීමට අදාල කටයුතු සිදුකර රැස්වීම් පවත්වා දිස්ත්‍රික් මිල කමිටු වාර්ථාව නිකුත් කරනු ලැබේ. |

| | |
|---|---|
| හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි | සාමාන්‍යයෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන මත විවිධ වැඩසටහන් යටතේ ග්‍රාමීය මට්ටමෙන් විවිධ පරාසයන් තුළ රු.10,000 ක පමණ සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කිරීම ප්‍රායෝගිකව නිශ්චය කළ නොහැකි ගැටලුකාරී තත්ත්වයක් බැවින් එවැන්නක් සිදු නොකරන ලදී.<br><br>මෙම වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත විවිධ වැඩසටහන් මඟින්, හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා අංශ හා නිලධාරී මට්ටමින් ඉලක්ක තීරණය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇත. |
| 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂය වන විට මෙම කාර්යාලය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර නොතිබුණි. 2024 වර්ෂයේ සකස් කර ඇත.<br><br>සකස් කරන ලද පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය අනුව කටයුතු සිදු වෙමින් පවතී.<br><br>පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියෙහි දැක්වෙන අයුරින් අදාළ කාර්යයන් ඉටුකර දෙන්නේද යන්න සම්බන්ධව ඒ ඒ අංශභාර මාණ්ඩලික නිලධාරීන් මඟින් පරික්ෂා කිරීමට ක්‍රමවේදයක් සැලසුම් කර ඇත. |
| ආයතනයේ පුරවැසි සේවා /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි. | රටෙහි පැවැති දේශපාලන, සමාජයීය හා ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් 2023 වර්ෂයේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 2 ක් පමණක් පවත්වා ඇත.<br><br>2026 වර්ෂය සඳහා මේ වන විට ප්‍රාදේශීය කමිටු 12 ක් පවත්වා ඇති අතර, ඉදිරියේදී ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 42 ක් හා දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 01ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ මුදල් අමාත්‍යංශ ලේකම්ගේ 01/2023 චක්‍රලේඛය අනුව ඒ ඒ නිලධාරීන් විසින් සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් අවස්ථා ලබා දිය යුතු බව දැන්වීම හේතුවෙන් අමතර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වුණි. මෙම වසරේ පවත්නා සම්පත් යොදා ගනිමින් පුහුණු වැඩසටහන් සිදු කිරීමට සැලසුම් කර ඇත.<br><br>2026 වර්ෂය සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පුහුණු සඳහා වෙන් කරන ලද මුදල් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් අප විසින් සංවර්ධනය කර ඇත.<br>ඒ අනුව පුහුණු වැඩසටහන් 13 ක් සඳහා දළ ඇස්තමේන්තු වටිනාකම රු. 1,580,965.00 ක් වන අතර, මේ වන විට එම පුහුණු වැඩසටහන් |

| | |
| --- | --- |
| | අතුරින් වැඩසටහන් 3 ක් මේ වන විටත් පවත්වා අවසන් කර ඇත. ඉහත වැඩසටහන් 13 ට අමතරව තාක්ෂණික හා වෙනත් ප්‍රායෝගික අවශ්‍යතා හේතුවෙන් වෙනත් පුහුණු මධ්‍යස්ථාන තුළදී පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීමට ද සැලසුම් කර ඇති අතර, ඒවායේ දළ ඇස්තමේන්තු වියදම රු. 1,895,000.00 ක් වේ. |

.........................

එස්. සිවරංජන්,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

එස්. සිවරංජන්
ප්‍රධාන ගණකාධිකාරී
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

.........................

සන්ධ්‍යා එන්.පී. අබේසේකර,
දිසාපති / දිස්ත්‍රික් ලේකම් (රා.ආ.),
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

සන්ධ්‍යා එන්.පී. අබේසේකර
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති (රා.ආ)
අනුරාධපුර

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2025 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ඉහළ නගා ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය